


# සාහිත්‍ය විචාර සම්ප්‍රදායක අවශ්‍යතාව

**ශාස්ත්‍රපති කපුරුබණ්ඩාර ජයතිලක**

අපේ රටේ නිර්මාණකරුවන්ට වඩා විචාරකයන් බහුල වූ සමයක් විය. ඔවුහු ස්වනිර්මාණයක් කිරීමට තරම් ප්‍රතිභාවෙන් හෝ කවි ශක්තියෙන් ආධුනිකයන් වූවද විචාරයේ ප්‍රවීණයෝ වූහ. නිර්මාණයක හොඳ නරක රස නිරස පැහැදිලි කරන්නට තරම් විදග්ධයෝ වූහ. බටහිර විචාර සංකල්ප හිස් මුදුනින් ගත් මොවුන්ගේ විචාරය පොදු රසික රුචිකත්වය පවා වෙනස් කිරීමට තරම් පොහොසත් විය.

මේ විචාරය ඉදිරියේ නිදහස් නිර්මාණකරුවන් පවා පසුබෑමට ලක් වූ බව පෙනේ. එසේම එළඹි අභියෝගයට මුහුණදීමට තරම් දිරිමත් වූ නිර්මාණකරුවන් නව විචාර සංකල්පවලට අනුගත වන පරිදි සාහිත්‍ය නිර්මාණ කරන්නට පෙළඹී ගිය බවද පෙනේ. නමුත් මේ අලුත් මග එතරම් දුර විහිද ගියේ නොවේ. ඒවායේ ප්‍රකට වූ ඒකාකාරී බවද රසිකයාට දිරවා ගත නොහැකි වීමද එය මුහුණ පෑ අභියෝගයෝ වෙති. ඒවා ක්‍රමයෙන් රසික ප්‍රසාදයෙන් ඈත් වන්නට විය. පොදු පාඨකයා තුළින් පැන නැගී මේ නව ප්‍රවණතාව නිසාදෝ එතෙක් හතු පිපෙන්නා සේ පළවූ විචාර පොත පතද සිදී ගියේය.

ගෝලීය කරණයත් තාක්‍ෂණයේ භාවිතයත් නිසා අද සාහිත්‍ය පොත පත සීමිත අලෙවියකින් පසු නොපෙනී යයි. ඇතැම් පොතපතට ප්‍රමාණවත් ඇගැයීමක් නොලැබේ. මේ නිසා නිර්මාණකරුවන් තුළද දක්නට ඇත්තේ පසුබෑමකි. කෙටි කතා කවි හා නාට්‍ය පිටපත් කිසිදු ප්‍රකාශකයෙක් භාර නොගන්නා තත්ත්වයක් උදා වී ඇත.

කිසියම් නිර්මාණකරුවකු සිය අත මිට මුදල් වැය කරමින් නිර්මාණයක් මුද්‍රණය කළ ද එය අලෙවිකර ගැනීම බෙහෙවින් අසීරුය. මේ ආපදාවට මූලික හේතුව වී ඇත්තේ කියවන්නන් හිඟකම නොව ප්‍රමාණවත් ප්‍රශසත විචාරයක් නොමැතිකමය.

අද දිනපතාම වාගේ සාහිත්‍ය පොත පත බහුල වශයෙන් ප්‍රකාශයට පත් වේ. මේවා මිලදී ගෙන කියවීමට පාඨකයන් දක්වන උනන්දුවද බෙහෙවින් අඩුය.

> අඩු ශ්‍රමයකින් ක්ෂණිකව තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට උපයෝගී වන දේ කියවීමට මිනිස්සු ආශා කරති. ප්‍රේමයටත් විරහවටත් යොමු වී ඇති ගීතය ජනප්‍රියව පවත්නා මෙකල නිර්මාණ සාහිත්‍යයද සම්බෝගය හා විපුලම්භය පවසන මාධ්‍යයක් බවට පත් වී ඇත. මේ නිසා හොඳ සාහිත්‍ය නිර්මාණයක් සොයා ගැනීමද බෙහෙවින් ඇසීරුව ඇත. ඒ සඳහා උචිත මග පෙන්වීමක් ද නැත.

විද්‍යුත් මාධ්‍ය බහුලත්වය මීට ප්‍රධාන හේතුව සේ සමහරු දකිති. අද සමාජය තුළ කියවීමේ රුචිය පහත වැටීම මෙයද හේතුවක් සේ දකිති.

මේ නිගමනය කොතෙක් දුරට පිළිගත හැකිද ? දිනපතා ජාතික පුවත්පත්, විකල්ප පුවත්පත් හා සඟරා වෙළෙඳපොලේ බහුලව දක්නට ලැබේ.

මේවා මේ තරම් පළ වන්නේ පාඨකයන් කියවන නිසා නොවේ ද ? එසේ නම් අද සමාජය කියවීමට රුචියක් නොදක්වන්නේ යයි කිව හැකිද ? කියවීම විභාග ජය ගැනීමේ අධ්‍යයන කාර්යක් බවට පත් වී ඇති මේ යුගයේ නිර්මාණාත්මක සාහිත්‍ය කියවීමට දක්වන මැළිබව පුදුම විය යුතු කරුණක් ද නොවේ.

අඩු ශ්‍රමයකින් ක්ෂණිකව තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට උපයෝගී වන දේ කියවීමට මිනිස්සු ආශා කරති. ප්‍රේමයටත් විරහවටත් යොමු වී ඇති ගීතය ජනප්‍රියව පවත්නා මෙකල නිර්මාණ සාහිත්‍යයද සම්බෝගය හා විපුලම්භය පවසන මාධ්‍යයක් බවට පත් වී ඇත.

මේ නිසා හොඳ සාහිත්‍ය නිර්මාණයක් සොයා ගැනීමද බෙහෙවින් ඇසීරුව ඇත. ඒ සඳහා උචිත මග පෙන්වීමක් ද නැත. හොඳ නවකතාවක කෙටි කතාවක අගය පැහැදිලි කර දෙමින් ඇගැයීමක් කරමින් රසිකයාගේත්, පාඨකයාගේත් අවබෝධය පුබුදු කරන විචාර මාර්ගයක් නොමැතිවීම මීට ප්‍රධාන හේතුව වේ. පෙර අපර විචාර සංකල්පවල ගැටීම විචාරකයන් අන්ද මන්ද කොට ඇති සෙයක් පෙනේ. අපේ සාහිත්‍ය විචාරයට සුදුසු විචාර මාර්ගයක් ගැන සිතන්නට විචාරකයන්ගේ පෙළඹීම අත්‍යවශ්‍ය කාලයකි මේ.

බටහිර විචාර සංකල්ප අප රටේ බහුලව ව්‍යාප්ත වන්නට පටන් ගත්තේ හැටේ දශකයේය. සම්ප්‍රදායක් ලෙස සංවිධිත ව්‍යාපාරයක් ලෙස ගොඩ නැගුණු ලිඛිත විචාර මාර්ගයක් අප සතුව නොපැවතියත් ඉතිහාසය පුරා ප්‍රශස්ත විචාර සංකල්ප සමුච්චයක් අප සතුව ඇති බව පෙනේ. අනුරාධපුර යුගයේ සිරිත්මිණි ආරෙන් පටන් ගෙන සීතාවක යුගයේ සුභාෂිතය දක්වා ලියැවුණු ඇතැම් පොත පතේ අපට ආවේනික විචාර සංකල්ප රාශියක් දක්නා ලැබේ.

අපේ ලේඛකයන් කවියන් විචාරයට මහත් බියක් දැක්වූ බව ද පෙනේ. ඒ නිසාම විචාරකයා ලඝු කොට සැලකූ බවක් ද දැකිය හැකිය. කෙසේ වුවද අපේ මේ විචාර සංකල්ප හා බටහිර විචාර සංකල්ප එකතුවෙන් අපට උචිත විචාර මාර්ගයක් සකසා ගැනීම අපහසු නොවේ. විද්වත් රසිකයන් මේ පිළිබඳව අවධානය යොමු කරන්නේනම් අද අවපාතයට ලක් වී සුසුම් ලන විචාරයට නව පනක් දිය හැකි වනු නො අනුමානය. එවන් විචාර සම්ප්‍රදායක් ගොඩ නැගීම කාලීන අවශ්‍යතාවයකි. මක්නිසාද යත් ප්‍රශසත විචාරයකින් තොරව ගුණාත්මක නිර්මාණ සාහිත්‍යයක් බිහි නොවන නිසාය.

සාහිත්‍යය නිර්මාණය රසාස්වාදය හා විචාරය යන අංගත්‍රයෙන් යුතු ව්‍යාපාරයකි. මේ අතර නිර්මාණයත් විචාරයත් සමගාමීව ගමන් ගන්නා කාර්ය දෙකක් බව මහාචාර්ය විමල් දිසානායක සූරීහු කියති. ඒ නිසාම සාහිත්‍යයේ ප්‍රගතියට විචාරයෙන් විපුල මෙහෙයක් ඉටුවන බවත් විචාරකයාගේ මාර්ගෝපදේශකත්වයෙන් තොරව සාහිත්‍යයේ ක්‍රමික සංවර්ධනයක් නොවන බව ද කියති. පණහ දශකයේ සිට හැත්තෑව දශකය දක්වා මේ රටේ පළ වූ විචාර පොත පත බොහෝය.

නමුත් විශිෂ්ට නිර්මාණකරුවන් බිහි වී ඇත්තේ අල්ප වශයෙන්ය. මාර්ටින් වික්‍රමසිංහ ජී.බී.සේනානායක, කේ.ජයතිලක, ඒ.වී.සුරවීර ආදීන්ගේ නිර්මාණ කියවන විට පෙනී යන්නේ ඔවුන් දේශීය කතා කලාවෙන් හා සංස්කෘතික පරිසරයෙන් ලද පන්නරයක් ඇතිව ලේඛනයේ නිරත වූ නිසා ඔවුන්ගේ නිර්මාණ විශිෂ්ටත්වයට පත් වී ඇති බවය. බටහිර විචාර සංකල්ප හිස් මුදුනින් නොගත් නිසා බවද පෙනී යයි. ඒවා අපේ සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවල එන විශිෂ්ට නිර්මාණ හා සසඳමින් වුවද රස විඳිය හැකිය.

විචාරය වූකලී කිසියම් අප්‍රකට දෙයක් නොපැහැදිලි කරුණක් හෝ අගය කළ යුතු යමක් හේතු සාධක මගින් පැහැදිලි කිරීම බව සංස්කෘත ආලංකාරිකයෙකු වූ විශ්වනාථ කියයි. සාහිත්‍ය විචාරයේ සුවිශේෂ අරමුණ වන්නේ කෘතියේ අර්ථ ගෙන හැර දැක්වීම මගින් රසිකයා නිවැරදි මගට යොමු කිරීම බව බටහිර ප්‍රකට විචාරකයෙකු වන ටී.ඇස්.එලියට් කියයි. සාහිත්‍ය රසාස්වාදයට රසිකයා නැඹුරු කිරීම විචාරයෙන් වන අමිල මෙහෙය බව මේ අදහස්වලින් පැවසේ.

උක්ත අරමුණ සාක් සාත්වීමට නම් මැදිහත්වුන් ප්‍රශසත වුත් විචාර සංකල්ප වලින් යුතු නවම, සම්ප්‍රදායක් අවශ්‍ය වෙයි. හොඳ විචාරයකින් රසිකයාගේ වින්දන ශක්තිය තීව්‍ර කරන අතරම එය රචකයාගේ නිර්මාණ ශක්තියද වර්ධනය කරයි. එහෙත් අද විචාරකයා නිහඬය. නිර්මාණ දොරට වැඩීමේ උත්කර්ෂවත් අවස්ථාවල එම කෘති අගයමින් කරන විචාරයන් බහුලය. පුවත් පත් මගින් නිර්මාණ හඳුන්වා දෙමින් කරන සරල විචාරද බහුලය.

මේ සියළු දේ නිර්මාණයේ ගුණ වැනීමට සීමා වී ඇති බව පෙනේ. ඉන් රචකයාට හෝ රසිකයාට අත්වන ප්‍රයෝජනයක් නැත. මේ තත්ත්වය උදා වී ඇත්තේ අපට උචිත විචාර සම්ප්‍රදායක් ගොඩ නැගී නැති නිසාය.

භාරතීය විචාර සංකල්ප අලංකාරවාදී යයි කියමින් බැහැර කිරීමෙන් ඊට සමීපවන දේශීය විචාර සංකල්ප නෙසලකා හැරීමත් මේ පසුබෑමට හේතු වී ඇති බව පෙනී යයි. අනෙක් අතට බටහිර විචාර සම්ප්‍රදායන්ට පමණට වඩා නැඹුරුවෙමින් සිය වස් ගණනාවක් සම්භාවතාවට පාත්‍ර වූ අපේ සම්භාව්‍ය සාහිත්‍ය නිර්මාණ ලඝු කොට සැලකීම නිසා රසිකයන් අතර වූ විසංවාදයන්ද ඊට එරෙහිව නැගී සිටීම තවත් හේතුවක් වූ බව පෙනේ. මෙයින් විචාරකයන් අන්ද මන්ද වූ සේය.



අද විචාරකයා නිහඬය. දිනපතා ක්ෂේත්‍රයට එක්වන නවකතා, කෙටිකතා, පද්‍ය, නාට්‍ය ආදී නිර්මාණ සංඛ්‍යාව අති මහත්ය. මේ හැම දෙයක්ම කේවල විචාරයට හසුකර ගැනීම ද දුෂ්කරය. එහෙත් කාටත් මැන කිරා ගත හැකි විචාර ඇගැයීම් පද්ධතියක් ගොඩ නඟා ගැනීම අපහසු නොවෙයි. එවිට රසිකයාට ද තමා කියවන පොතක හොඳ නරක හඳුනා ගත හැකිය.

විචාරයේ ප්‍රකෘතියට සමීපවීමට ඔවුහු අපොහොසත් වූ බව සිතිය හැකිය. කෙසේ වූවද ප්‍රබුද්ධවුත් විදග්ධ වුත් විචාරකයන් සාහිත්‍ය විචාරයෙන් ඉවත්වීම සාහිත්‍යයේ හරසුන් බවටත් ඒ නිසාම රසිකයන්ගේ කියවීමේ රුචිය මන්ද ගාමීවීමටත් හේතු වී ඇති බව පෙනේ.

සිංහල නිර්මාණ සාහිත්‍යය අද මුහුණ පා ඇති මේ පසුබෑම වළක්වා ගත හැක්කේ කාලයටත් දේශයටත් සංස්කෘතියටත් ගැලපෙන විචාර සංකල්ප පද්ධතියක් සකසා ගැනීමෙන්ය.

විචාරය සඳහාම වූ කෘතියක් අපේ සම්භාව්‍ය සාහිත්‍ය ක්ෂේත්‍රයේ නොදක්නා ලැබෙන නමුදු ප්‍රශසත විචාර සම්ප්‍රදායක් අපට උරුමව පැවති බව සාහිත්‍යයේ විවිධාංගීකරණයක් ඇතැම් පොත පතේ සඳහන් තොරතුරුත් අනුව සිතා ගත හැකිය.

**පෙදෙහි රස් හව් විඳුනා**
**දෙනෙත ඉතා දුලබෝ**

යයි කවි සිළුමිණ කර්තෘ 11 වන පැරකුම්බා රජු පැවසුවේත්,

**මකියන වදන් රැස**
**කිවිහුම දනිති ගුණ දොස**
**දන්නා දනට මිස**

වෙසෙස නොදැනේ රුවන් තතු ලෙස් යයි සිරිරහල් හිමියන් පැවසුවේත් සාහිත්‍ය විචාරයේ යෙදන පිරිසක් සිටි නිසාමය.

**ගුණ දොස් කෙසෙගත්**
**නොදන්නා දෙනෙ කෙරෙ තොර**
**කිම අදහම ඇත සබඳ**
**රූබේ දස්තේ සියල්**

යයි සිය බස් ලකර සඳහන් කරයි.

රසිකයාගේ රසඥතා වර්ධනයට විචාරයෙන් නිසි මග පෙන්වීමක් කරන බව සත්‍යයකි.

එසේම තම ශක්‍යතා දුබලතා හඳුනා ගැනීමට රචකයාටද මහත්සේ ප්‍රයෝජනවත් වෙයි.රසිකයාත් රචකයාත් සමීප වූ තරමට සාහිත්‍යයද වර්ධනය වෙයි. රසිකයා සහෘදයෙකු වන තරමට නිර්මාණයට නිසි ඇගැයීමක් ලැබෙයි.

එහෙත් අද විචාරකයා නිහඬය.දිනපතා ක්ෂේත්‍රයට එක්වන නවකතා, කෙටිකතා, පද්‍ය, නාට්‍ය ආදී නිර්මාණ සංඛ්‍යාව අති මහත්ය. මේ හැම දෙයක්ම කේවල විචාරයට හසුකර ගැනීම ද දුෂ්කරය. එහෙත් කාටත් මැන කිරා ගත හැකි විචාර ඇගැයීම් පද්ධතියක් ගොඩ නඟා ගැනීම අපහසු නොවෙයි. එවිට රසිකයාට ද තමා කියවන පොතක හොඳ නරක හඳුනා ගත හැකිය.

එය සපුරා බටහිර විචාර සංකල්ප මතම ගොඩ නැගුනොත් එය ද රසිකයාට අරවා ගත නොහැකි වනු ඇත. එසේ හෙයින් අපේ විචාර සම්ප්‍රදායයේ ඇති බටහිර විචාර සංකල්ප සමග ද සමීප වන සංකල්ප එක් කොට නව විචාර සම්ප්‍රදායක් ගොඩ නගා ගැනීම අපහසු නොවේ. එය දැනට අපේ සම්භාව්‍ය සාහිත්‍ය මුහුණ පා ඇති දුර්භාග්‍යයෙන් ගලවා ගැනීමටද හේතු වනු ඇත.

ලේඛන භාෂාව රසය වස්තු විකාශය හා අපූර්වත්වයන් ජීවන දෘෂ්ටියන් වැනි දේද නිර්මාණයට වස්තුවන අත්දැකීමද පදනම් කොට ගත් විචාර පද්ධතියක් සකස් කර ගැනීමෙන් මේ කාලීන අවශ්‍යතාවට යම් රුකුලක් විය හැකිය.

**නූතන සිංහල නිර්මාණ සාහිත්‍යය බෙහෙවින්ම අත්දැකීම් පාදක වන බව පෙනේ. නිර්මාණකරු පරිකල්පනය මගින් තම අත්දැකීම් විෂධ කොට ගනියි. අපේ සම්භාව්‍ය සාහිත්‍යය බෙහෙවින් ආගමික ස්වරූපයක් දරන මුත් ඊට ඔවුන්ගේ අත්දැකීම් පාදක නොවුවා යයි කිව නොහැක. සමාජය අතර වෙසෙමින් සමාජ ඇවතුම් පැවතුම් අධ්‍යයනයෙන් සමාජ අවශ්‍යතා හා ඉටුකරනු වස් තම රචනා කළ බව පෙනේ.**

අපේ නිර්මාණ සාහිත්‍යයට මග පෙන්වන ග්‍රන්ථයක් සේ සලකන සියබස් ලකරද එලියට් රිචර්ඩ්ස් ලිවිස් වැනි බටහිර විචාරකයන්ගේ සංකල්පද සලකා බලමින් එකමුතුවෙන් වඩා උචිත විචාර සම්ප්‍රදායක් ගොඩ නගා ගත හැකිය.

නූතන සිංහල නිර්මාණ සාහිත්‍යය බෙහෙවින්ම අත්දැකීම් පාදක වන බව පෙනේ. නිර්මාණකරු පරිකල්පනය මගින් තම අත්දැකීම් විෂධ කොට ගනියි. අපේ සම්භාව්‍ය සාහිත්‍යය බෙහෙවින් ආගමික ස්වරූපයක් දරන මුත් ඊට ඔවුන්ගේ අත්දැකීම් පාදක නොවුවා යයි කිව නොහැක. සමාජය අතර වෙසෙමින් සමාජ ඇවතුම් පැවතුම් අධ්‍යයනයෙන් සමාජ අවශ්‍යතා හා ඉටුකරනු වස් තම රචනා කළ බව පෙනේ. බුදු සිරිත පවා ඔවුන් විකාශනය කරන්නේ තම අත්දැකීම් පාදක කර ගනිමින් බව සද්ධර්ම රත්නාවලිය පූජාවලිය සදැකිදුරු කාව්‍යය ගුත්තිලල කාව්‍ය ආදිය මෙන්ම සංදේශ කාව්‍ය විමසීමෙන් පෙනී යයි.

ලේඛකයා හෝ කවියා අත්දැකීම් මුසු පරිකල්පනයන් රසිකයා වෙත ඉදිරිපත් කරන්නේය ලේඛනයෙනි. නැත්නම් කෘතියෙන් මෙහි දී ඔහුගේ ප්‍රධාන මෙන්ම ප්‍රබල වාහකය වන්නේ බස්වහරයි අපේ සම්භාව්‍ය පොතපතේ මිශ්‍ර සිංහල භාෂා ව්‍යවහාරයක් දක්නා ලැබෙන නමුදු ඔවුහු ප්‍රාණවත් බස්වහරකින් රසිකයා ඇද බැද ගැනීමට උත්සාහ දරති. සාහිත්‍ය කෘතියෙන් නිර්මාණය වන්නේ වචනවලින් බව කියන ඇස්.ඒ රිචර්ඩ්ස් බස්වහර විමසීමට ලක් නොකර සාහිත්‍ය කෘතිය පිළිබඳ මනා විචාරයක් කළ නොහැකි බව කියයි. මේ අද්‍යතන සංකල්පය මීට වසර දහස් ගණනකට පෙර මෙරට රජ කළ 1 වන සේන නිරිදුන් ද පවසා තිබේ. හෙතෙම සිය බස් ලකරේ මෙසේ පවසයි.

**"ගවගන වේ පසස්**
**නදා බස්කර සුසකස්**
**පිය සුවහට ඒ අන්හට**
**ගව බව්ම හුදු සාදා"**

බස මනාසේ යොදා ගනිමින් කළ නිර්මාණය සිතු පැතු සම්පත් දෙන සුරභිධෙනුවකි. එසේ නොවූ විට නිකම්ම එළ දෙනෙකි. සංකල්ප රූපවලින් තොරව නිර්මාණය කරන ලද කාව්‍ය අපූර්ව වස්තුවක් නොවනවා පමණක් නොව එය රස සුන් බවට ද පත්වෙයි. ශබ්ද රසයෙන් අර්ථ රසයෙන් හීන වන විට තමා විසින් අපූර්ව දෙයක් දැක්කේය.

යන හැඟීම රසිකයාගෙන් බැහැර වන විට ඉන් ලැබෙන රසයක් ද නැත. එය හුදු වාර්තාවක් බවට පත්වෙයි. සංස්කෘත ආලංකාරිකයන් දක්වන ද්‍රව්‍යවාදය ඖචිත්‍යවාදය ගුණවාදය අසංකල්ප වලින් උත්සාහ දරා ඇත්තේ ද රසිකයා මුහුණ පාන මේ දුෂ්කරතාවෙන් ගලවා ඔහුට ගැඹුරු රසාස්වාදයක් ලබා දීමය.

කිසියම් අත් දැකීමක් කාව්‍යෝක්තීන්ගෙන් තොරව ඉදිරිපත් කරන විට එය අපූර්ව වස්තුවක් නොවෙයි. ද්වනියක් හෝ ඖමිත්‍යයක් නැති විට එය හුදු වාර්තාවක් වෙයි.

**"ගතොසත මක්‍රා භාතීන්ද්‍රර්**
**යානති වාසාය පක්ෂිණ:**
**ඉතෙවමාදී කිං කාව්‍යම**
**වාර්ෂා මෙනාම් ප්‍රචක්‍ෂතෙ"**

යනුවෙන් කියන "බාමහ" නම් අලංකාරිකයා, හිර බැස ගියේය. සඳ නැගිණ. පක්ෂීහු කූඩු කරා පියාඹත් යයි කියු විට එය වාර්තාවක් විනා කාව්‍යයක් නොවන බව කියයි. මේ අදහසම සියබස්ලකර කරුවෝ මෙසේ කියති.

**"කැමතිය මමන කත්**
**කෙසේ නොඉස්තිවියන්**
**ගම්වැසි වදනරුන්**
**රසහුන් බවෙහිම වැටේ"**

මම තිට කැමැතිය. තී මට කැමති නොවන්නේ ඇයි. මෙය ගම්වැසි වදනරුතක් බව කියන සිය බස්ලකර ඉන් රසයක් විදිය නොහැකි බව කියයි. සංකල්ප රූප වලින් තොර කාව්‍යය නීරස බව බටහිර විචාරයද පිළිගනී. අපේ කවින් නිතරම කාව්‍යාලංකාර භාවිතයට පෙළඹී ගොස් ඇත්තේ ද මේ යථාර්ථය ප්‍රත්‍යක්ෂ කිරීම නිසා යයි සිතිය හැකිය.

වස්තුවට උචිත නොවන සිද්ධි ගපා ගැනීමෙන් නිර්මාණයට අතිශයෝක්තියෙන් ආරෝපනය වන බවත් එය යථාර්ථය අභිබවා යන බවත් කියන බටහිර විචාරකයෝ එයින් නිර්මාණය අවිශ්වාසණිය බවට පත් වන හෙයින් ගැඹුරු රසයක් විදිය නොහැකි බව ද කියති. නිර්මාණයේ විය යුතු ස්වභාවෝක්තිය යථාරූපී බවත් අපේ සාම්ප්‍රදායික විචාරය පිළි ගනී.

**"නොතන්හි වැණුමෙවන්**
**නොවෙසෙස් කියමින් කිසිත්**
**නොසබද පබද දසවන්**
**පිය වදන් නොකරන් පඬි**

"යනුවෙන් සඳහන් කරන සියබස්ලකර නුසුදුසු තැන්හි වර්ණනාවද වස්තුවට අනුචිත කථනයද අව්‍යක්ත බස් වහරද අසම්බන්ධ වූ සිද්ධි ගැලපීමද කවීන් විසින් නොකළ යුතු බව කියයි.

සාහිත්‍ය නිර්මාණයෙන් කරන්නේ පාඨක රසික සිත් රසයෙන් ආනන්දයෙන් පුරවාලීම බව ටී.එස්.එලියට් කියයි. පෙර දිග සාහිත්‍ය සමග සිංහල සාහිත්‍යය ද සංස්කෘත රසවාසය අගය කරයි. සාහිත්‍ය රසය කොතරම් වැදගත් කොට සැලකුණේ ද යත් එය බ්‍රහ්මාස්වාදයේ සහෝදරයා ලෙස සැලකේ.

සාහිත්‍ය නිර්මාණයක් රස විදීමේදීත් විචාරයේදීත් අනුගමනය කළ හැකි ක්‍රමවේදයේ මූලික ලක්ෂණ අතින් පෙර අපර දෙදිගම සමරූපී බවක් ගන්නා අයුරු මේ තොරතුරුවලින් පෙනී යයි. එබැවින් මේ සිද්ධාන්ත සැලකිල්ලට ගනිමින් අපට උචිත විචාර සම්ප්‍රදායක් ගොඩ නගා ගැනීම දුෂ්කර නොවේ. අපේ විදග්ධ රසිකයන් උක්ත කාර්යය සඳහා පෙරමුණ ගැනීම කාලීන අවශ්‍යතාවකි. එවිට පණ අදින විචාරයට නව ජවයක් කැවිය හැකිය.

මෙවන් විචාර සම්ප්‍රදායක් ගොඩ නගා ගත හැකිනම් දැනට නීරස සේ සලකන අපේ සම්භාව්‍ය සාහිත්‍යයේ බොහෝ නිර්මාණ කියවීමටත් රස විදීමටත් ප්‍රශස්ත ලෙස අගය කිරීමටත් පාඨකයන් හා රසිකයන් පෙළඹෙනු නොඅනුමානය.

එසේම සංස්කෘතික අනන්‍යතාව, සාරධර්ම මුසු නව නිර්මාණ කිරීමට ආධුනික ලේඛකයන් හා කවීන් උද්‍යෝගීමත් වනු ඇත. ❒